# ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

## භාවිතයෙන් ඉවත් කරන ලද වාහන, යන්ත්‍රෝපකරණ හා අබලි ද්‍රව්‍ය විකිණීම සඳහා මිල ගණන් කැඳවීම.

## උපදෙස් හා කොන්දේසි මාලාව.

1. 2023.06.02 වෙනි දින ජාතික පුවත්පත්වල පළ වූ පුවත්පත් දැන්වීම පරිදි මෙම අධිකාරියට අයත් වාහන, යන්ත්‍රෝපකරණ හා අබලි යකඩ ද්‍රව්‍ය විකිණීම පිණිස 2023.06.05 වන දින පෙ.ව. 9.30 සිට 2023.06.20 වන දින ප.ව.2.00 දක්වා මිල ගණන් භාරගනු ලැබේ. ඒ අනුව මහවැලි අධිකාරියේ <u>කොළඹ ප්‍රධාන කාර්යාලය - බී කලාපය - වැලිකන්ද, සී කලාපය - දෙහිඅත්තකණ්ඩිය (තෝඩා ගොවිපල, රත්කිද ගොවිපල), වික්ටෝරියා /ඊ කලාපය - දිගන, ඩී කලාපය - මැදිරිගිරිය, එච් කලාපය - (නිරාවිය ගොවිපල/ යාන්ත්‍රික වැඩපල - තඹුත්තේගම) වලව කලාපය - ඇඹිලිපිටිය, එල් කලාපය - වැලිඔය, මහවැලි ආරක්ෂක බලකාය - දිගන, රඹකැන්ඔය කලාපය- මහඔය, මොරගහකන්ද කලාපය - (යාන්ත්‍රික වැඩපල - බකමූණ) ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය (දිගන, රන්දෙණිගල, පොල්ගොල්ල, මාදුරුඔය, මාපාකඩ, බෝවතැන්න)</u> යන ස්ථානයන්හි දී මෙම වාහන, යන්ත්‍රෝපකරණ සහ අබලි ද්‍රව්‍ය 2023.06.05 දින සිට 2023.06.19 වන දින දක්වා පෙ.ව. 9.30 සිට ප.ව.3.00 තෙක් (රජයේ නිවාඩු දිනයන් සහ සති අන්ත දිනයන් හැර) පරික්ෂා කර බැලිය හැකිය.

2. අයදුම්පත්‍රය මිලදී ගන්නා ලදුපත අවසර පත්‍රය වශයෙන් භාවිතා කිරීමට ඉඩ දෙනු ලැබේ. වාහන හා අබලි ද්‍රව්‍ය පරීක්ෂා කිරීමට අවසර දෙනු ලබන්නේ ලදුපත හිමි අයට පමණි.

3. භාවිතයෙන් ඉවත් කරන ලද වාහන/ යන්ත්‍රෝපකරණ හා අබලි යකඩ ද්‍රව්‍ය සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට අයදුම්පත් නිකුත් කිරීම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පහත සඳහන් කාර්යාල වලදී සිදු කෙරේ.

| | | | |
|---|---|---|---|
| I. | ප්‍රධාන කාර්යාලයේ 07 වන මහලේ මුදල් අංශයේ සහකාර අධ්‍යක්ෂ (මුදල් - වත්කම්/ ගබඩා) වෙතින් හා, | | |
| II. | බී කලාපය | - | වැලිකන්ද |
| III. | සී කලාපය | - | දෙහිඅත්තකණ්ඩිය |
| IV. | ඩී කලාපය | - | මැදිරිගිරිය |
| V. | මොරගහකන්ද (ජී) කලාපය | - | මොරගහකන්ද (බකමූණ) |
| VI. | එච් කලාපය | - | තඹුත්තේගම |
| VII. | එල් කලාපය | - | සම්පත්නුවර, වැලිඔය |
| VIII. | වික්ටෝරියා / ඊ කලාපය | - | දිගන |
| IX. | රඹකැන්ඔය කලාපය | - | මහඔය |
| X. | වලව විශේෂ බල ප්‍රදේශය | - | ඇඹිලිපිටිය |
| XI. | මහවැලි ආරක්ෂක බලකාය | - | දිගන |
| XII. | යාන්ත්‍රික වැඩපල (තඹුත්තේගම) | - | තඹුත්තේගම |
| XIII. | ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය | - | දිගන |

4. අයදුම්පත් ලබා ගැනීමේදී වාහන සඳහා අයදුම්පත් අංක 01 ද යන්ත්‍රෝපකරණ හා අබලි යකඩ ද්‍රව්‍ය සඳහා අයදුම්පත් අංක 02 ද ලෙස වෙන වෙනම අයදුම්පත් ලබා ගත යුතුය.

Reference Only

5. ඉහත කාර්යාලවල ගණකාධිකාරී වෙතින් 2023.06.05 දින සිට 2023.06.19 දින දක්වා පෙ.ව.9.30 සිට ප.ව.3.00 තෙක් ආපසු නොගෙවන තැන්පතුවක් ලෙස රු. 3500/- ක මුදලක් ගෙවීමෙන් පසු අයදුම්පත් ලබා ගත හැකිය.(රජයේ වැඩ කරන දින වල)

6. උක්ත වාහනවල දැනට පවතින හිඟ ආදායම් බලපත්‍ර ගාස්තු වාහන මිලදී ගන්නා අය විසින් දැරිය යුතු වේ.

7. වාහන වල අයිතිය පැවරීමට අදාල ලියකියවිලි සකස් කර දෙනු ලබන අතර එතෙක් ඒ බව සහතික කර තාවකාලික ලිපියක් නිකුත් කරනු ලැබේ.

8. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ගණකාධිකාරී නිකුත් කරනු ලබන අයදුම්පත්‍ර පමණක් මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා භාවිතා කල යුතුය. නියමිත අයදුම්පත්‍රයෙන් බාහිරව මිල ගණන් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. භාවිතයෙන් ඉවත් කරන ලද වාහන සඳහා එක් අයදුම්පත්‍රයක්ද, භාවිතයෙන් ඉවත් කරන ලද යන්ත්‍රෝපකරණ හා අබලි ද්‍රව්‍ය සඳහා වෙනම අයදුම්පත්‍රයක්ද වශයෙන් වෙන වෙනම අයදුම්පත්‍ර යොමු කල යුතුය. සෑම අයදුම්පත්‍රයක් සමගම රු. 3500/- ක් ගෙවා ලබා ගත් ලදුපතේ පිටපතක් යා කල යුතුය.

10. අදාල අයදුම්පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කර ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සමඟ මිල ගණන් ඉදිරිපත් කරනු ලබන කාණ්ඩ/කාණ්ඩය සඳහා අදාල වන ඇප තැම්පතු මුදල ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. එක් එක් කාණ්ඩය සඳහා අදාල වන ආපසු ගෙවනු ලබන ඇප තැම්පතු මුදල ටෙන්ඩර් භාණ්ඩ ලේඛණයේ එක් එක් කාණ්ඩය ඉදිරියෙන් සඳහන් කර ඇත. ඒ අනුව,

    i. පිළිගත් වාණිජ බැංකුවකින් අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (Director General, Mahaweli Authority Of Sri Lanka) නමට දින 60 ක වලංගු කාලයකට බැංකු අණකරයක් (Bank Draft) ලබා ගෙන හෝ

    ii. අදාළ මුදල ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ඉහත 02 හි සඳහන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යාලයක් වෙත ගෙවීමෙන් පසු නිකුත් කරනු ලබන ලදු පත ලබා ගෙන එහි මුල් පිටපත මිල ගණන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රයට අමුණා යොමු කල යුතුය.

11. සියළුම ලොට් අංක වලට අදාල භාණ්ඩ වෙන වෙනම ඇගයීමට ලක් කරන අතර කොන්දේසි සියල්ල සපුරා ඇති හා ඉහළම මිල ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් තාක්ෂණික ඇගයීම් කමිටුවෙහි නිර්දේශයන් මත තෝරා ගැනීම සිදු කරනු ලබයි. තෝරා ගන්නා ලද අයදුම්කරුවන්ට දැන්වීමෙන් පසු එම භාණ්ඩ දින 14 ක් ඇතුලත සියළුම මුදල් ගෙවා පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතු අතර ඉන් පසු මෙම බැංකු අණකරය/තැම්පත් මුදල නිදහස් කරනු ලැබේ. එසේම අදාළ භාණ්ඩ ලබා දිමට තෝරාගන්නා ලද අයදුම්කරුවන් එම භාණ්ඩ, මුදල් ගෙවා පරිශ්‍රයෙන් දින 14 තුල ඉවත් කර නොගන්නේ නම්, එම අයදුම්කරුවන් වෙත මෙම තැම්පතු මුදල (බැංකු අණකරය හෝ ගෙවන ලද මුදල) ආපසු නොගෙවන අතර අදාළ භාණ්ඩ ලබා ගැනිමට සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට මෙම බැංකු අණකරය ටෙන්ඩර් පත් විවෘත කල දින සිට මාස 02 ක් ඇතුලත ආපසු ලබා දෙනු ලැබේ.

12. නිසි ලෙස සම්පූර්ණ කරන ලද මිල ගණන් සහිත අයදුම්පත්‍රය 2022.06.20 දින ප.ව. 2.00 ට පෙර ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ 09 වන මහලේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. නැතහොත් 2022.06.20 දින ප.ව. 2.00 ට පෙර ලැබෙන සේ

Reference Only

අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ප්‍රසම්පාදන අංශය, අංක 500, ටී.බී.ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කල යුතුය. 2022.06.20 වන දින ප.ව. 2.00 ට පසු ලැබෙන (ප්‍රමාද වී ලැබෙන) සියළුම මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිල ගණන් විවෘත කිරීම, මිල ගණන් ලබා ගැනීම අවසන් වූ වහාම මෙම ලිපිනයෙහිදීම සිදු කරනු ලබන අතර ඒ සඳහා අයදුම්කරුට හෝ නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

13. ඉහත අංක 02 යටතේ දක්වා ඇති ස්ථාන වලින් අයදුම්පත්‍රය ලබා ගත හැකි වුවද සම්පූර්ණ කරන ලද මිල ගණන් සහිත අයදුම්පත්‍රය අංක 08 හි සඳහන් පරිදි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී.බී.ජයා මාවත, කොළඹ 10 ලිපිනයේ පිහිටා ඇති <u>ප්‍රධාන කාර්යාලය වෙත පමණක්</u> යොමු කල යුතුය.

14. මිල ගණන් බහාලන කවරය ඉහළ වම් කෙළවරේ "භාවිතයෙන් ඉවත් කරන ලද වාහන සඳහා මිල ගණන් කැඳවීම" / "යන්ත්‍රෝපකරණ හා අබලි යකඩ ද්‍රව්‍ය සඳහා මිල ගණන් කැඳවීම" යනුවෙන් සටහන් කල යුතුය. දකුණු කෙළවරේ පහළින් මිල ගණන් ඉදිරිපත් කරන අයගේ නම සහ ලිපිනය හා දුරකතන අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

15. භාණ්ඩ පරික්ෂා කර මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර , අඩුපාඩු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වග කියනු නොලැබේ.

16. අපහරණය සඳහා ඉදිරිපත් කර ඇති ඕනෑම අයිතමයක් ටෙන්ඩර් ක්‍රියාවලියෙන් ඉවත් කර ගැනිමේ අයිතිය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් සතුය.

17. ප්‍රසම්පාදන ක්‍රියාවලියේදි මතුවන ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

18. මිල ගණන් ඉදිරිපත් කිරීමේදී එක් එක් කාණ්ඩ (ලොට්) අංක සඳහා වෙන් වෙන් වශයෙන් මිල ගණන් ඉදිරිපත් කල යුතු අතර උපදෙස් හා කොන්දේසි වලට අනුකූල නොවන අයදුම්පත් ඇගයීම් ක්‍රියාවලියේදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

19. තමන් මිලදී ගැනීමට අපේක්ෂා කරන භාණ්ඩ වල නම සඳහන් තීරුවේ ඔබ විසින් ඉදිරිපත් කරන මිල හා ඒ සඳහා ඉදිරිපත් කරන ඇප පිළිබඳ විස්තර ඇතුලත් කර අනෙකුත් තීරු තනි ඉරකින් කපා දැමිය යුතුය.

20. ඒ ඒ අයදුම්පත්‍රයට අනුව භාණ්ඩ කීපයක් සඳහා වුවද මිල ගණන් ඉදිරිපත් කල හැකි අතර ඒවායේ වටිනාකමට අදාලව තැම්පත් කල යුතු ඇප තැම්පත් මුදල එක් රිසිට් පතකින්/බැංකු අණකරයකින් ඉදිරිපත් කල හැකිය.

21. අයදුම්පත්‍රය සමඟ ඇති ඇමුණුමේ තමන් විසින් මිල ගණන් ඉදිරිපත් කල භාණ්ඩ වල එකතුව එහි අවසානයේ එකතුව තීරුවේ ඇතුලත් කර එම වටිනාකම අයදුම්පත්‍රයේ අංක 05 තීරුවේ ඇතුලත් කල යුතුය.

කීර්ති බී. කොටගම
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

Reference Only